## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවයේ අධි පන්තිය/ ප්‍රධාන අධීක්ෂණ කළමණාකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: ශ්‍රී ලංකා දුම්රිය
යොමු අංකය : ප.02/174/2016 දිනය : 2022.04.21

1.2 අමාත්‍යාංශය: ප්‍රවාහන
යොමු අංකය : MT/03/02/01/4/4 දිනය : 2022.05.09

1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
යොමු අංකය : DMS/1142 දිනය : 2014.04.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:
යොමු අංකය : EST-2/7/REC/1302 දිනය : 2022.01.07

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය:
යොමු අංකය : NSCC/02/43/SR-111(කාව - 1) දිනය : 2021.09.21

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/05-01-23/02/2021 දිනය : 2022.07.28

02. පත් කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර - අධිපන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාර්ය පිළිබඳ පොදු නිර්වචනය :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය ධාවනය කිරීමේ කාර්යයේ දී දුම්රිය මාර්ග, පාලම්, ගොඩනැගිලි, සංඥා හා විදුලි සංදේශ, යාන්ත්‍රික හා විදුලි හා ධාවනාගාරයන්හි අදාළ කාර්යයන් කළමනාකරණය කර ඉංජිනේරුමය කාර්යයන්ට අනුකූලව ඉටු කිරීමේදී අධීක්ෂණ කාර්යය සඳහා විශේෂිත තාක්ෂණික හා කළමනාකරණ නිපුණතාවයකින් හා මනා සම්බන්ධීකරණ හැකියාවකින් යුත් අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉහළ පළපුරුද්දකින් හෙබි අධීක්ෂණ කාර්යයන් ඉටු කරනු ලබන මාණ්ඩලික ශ්‍රේණියට අයත් සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. **තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය :**

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය).

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN 7 - 2016

5.2 වැටුප් පරිමාණය : රු. 41,580 – 11 x 755 – 18 x 1030 – 68,425/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර :

| තනතුර | ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|---|
| අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග, ගොඩනැගිලි, පාලම්, ධාවනාගාර, කර්මාන්තශාලා, සංඥා හා විදුලි සංදේශ) | විශේෂ | පියවර 05 | 44,600/- |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග, ගොඩනැගිලි, පාලම්, ධාවනාගාර, කර්මාන්තශාලා, සංඥා හා විදුලි සංදේශ) | විශේෂ | පියවර 07 | 46,110/- |

2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 03/2016 උපලේඛණ II හි සඳහන් පරිදි විය යුතුය.

06. **සේවා ගණයට අයත් තනතුර/ තනතුරු :**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | විශේෂ | 08 | විශේෂ පන්තියේ ස්ථිර මාර්ග පරීක්ෂකවරුන් හා III, II, I අධීක්ෂණ කළමනාකරුවන් විසින් සිදු කරනු ලබන සියලුම රාජකාරී නිසි ලෙස සිදු වන බව අධීක්ෂණය කිරීම, දුම්රිය මාර්ග පාලම් දැමීමෙන් හා දුම්රිය මාර්ග මාරුවෙන ස්ථාන වල අලුත්වැඩියා කටයුතු අධීක්ෂණය කිරීම යන ක්‍රියාවලියේදී අදාල ඉංජිනේරුමය කාර්යයන් දිස්ත්‍රික් ඉංජිනේරුගේ උපදෙස් පරිදි සම්බන්ධීකරණය කර කළමනාකරණය කිරීම. ස්ථිර මාර්ග අංශවල වාර්ෂික ආයුධ හා උපකරණ වල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් සහ ආපදා කටයුතු වලදී පරීක්ෂණ පැවැත්වීම, මු.තා.ශි./ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර සේවයට අයත් සේවකයින් උසස් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම සහ දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | විශේෂ | 47 | දුම්රිය ධාවනයට උචිත අන්දමින් දුම්රිය මාර්ග පද්ධති අළුතින් ඉදිකිරීම, දුම්රිය මාර්ග අලුත් වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාමේ දී III, II, I ශ්‍රේණිවලට අයත් අධීක්ෂණ කළමනාකරුවන්ගේ සියලුම කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය අධීක්ෂණය ලබා දීම. අධීක්ෂණ කළමනාකරුවෙකුගේ කාර්යභාර්යයන් නිසි පරිදි සිදු කිරීම සඳහා අංශ කිහිපයක් අතර සහ ධාවන කාර්යය මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් දුම්රිය ධාවනයට යෝග්‍ය වාතාවරණයක් ඇති කිරීම. |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | විශේෂ | 01 | විශේෂ පන්තියේ අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) විසින් සිදු කරනු ලබන සියළුම රාජකාරී නිසි ලෙස සිදු වන බව අධීක්ෂණය කිරීම හා ගොඩනැගිලි හා ව්‍යූහ ඉදිකිරීම් හා පවත්වාගෙන යාමේ ක්‍රියාවලියේදී අදාල ඉංජිනේරුමය කාර්යයන් දිස්ත්‍රික් ඉංජිනේරුගේ උපදෙස් පරිදි සම්බන්ධීකරණය කර කළමනාකරණය කිරීම. ගොඩනැගිලි අංශවල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් හා ආපදා කටයුතු වලදී පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ III, II, I නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් සමාලෝචන නිර්දේශ කිරීම, ගොඩනැගිලි අංශවල සියළුම ශ්‍රේණිවල උසස් කිරීම සඳහා පවත්වන සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, අංශභාර නිලධාරීන් විසින් අවශ්‍යතාවය මත සකස් කරන ලද ඇස්තමේන්තු නිර්දේශ කිරීම, දුම්රිය ගබඩා අධිකාරී විසින් ගොඩනැගිලි අංශ සඳහා ඇණවුම් කරන භාණ්ඩ ඒවා සුදුසු/නුසුදුසු බව නිර්දේශ කිරීම, ටෙන්ඩර් මඟින් හා මිල කැඳවුම් මඟින් භාණ්ඩ ඒවා ගැනීම සුදුසු/ නුසුදුසු බව නිර්දේශ කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | විශේෂ | 14 | දුම්රිය ගොඩනැගිලි හා ව්‍යූහයන් අළුතින් ඉදි කිරීම. අළුත්වැඩියා කිරීම හා පවත්වාගෙන යාමේදී III, II, I ශ්‍රේණිවලට අයත් අධීක්ෂණ කළමනාකරුවන්ගේ සියලුම කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය අධීක්ෂණය ලබා දීම, ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු හා අංශ කිහිපයක් අතර සහ අනෙකුත් උප දෙපාර්තමේන්තු වල හා බාහිර පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය කරමින් දුම්රිය ධාවනයට යෝග්‍ය වාතාවරණයක් ඇති කිරීම. |

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (පාලම්) | විශේෂ | 01 | විශේෂ පන්තියේ හා III, II, I පාලම් අධීක්ෂණ කළමනාකරුවන් විසින් සිදු කරනු ලබන සියලුම රාජකාරී නිසිලෙස සිදුවන බව අධීක්ෂණය කිරීම, දුම්රිය මාර්ග පාලම් දැමීමෙන් හා අළුත්වැඩියා කටයුතු පෞද්ගලිකව අධීක්ෂණය කිරීම, පාලම් අංශවල වාර්ෂික ආයුධ හා උපකරණවල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් හා ආපදා කටයුතු වලදී පරීක්ෂණ පැවැත්වීම, මු.තා.ශි/ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර සේවයට අයත් සේවකයින් උසස් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම සහ දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (පාලම්) | විශේෂ | 07 | දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය පාලම් පද්ධති අළුතින් ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේදී III, II, I ශ්‍රේණිවලට අයත් අධීක්ෂණ කළමනාකරුවන්ගේ සියලුම කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය අධීක්ෂණය ලබා දීම. අධීක්ෂණ කළමනාකරුවෙකුගේ කාර්යභාරයන් නිසි පරිදි සිදු කිරීම සඳහා අංශ කිහිපයක් අතර සහ ධාවන කාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් දුම්රිය ධාවනයට යෝග්‍ය වාතාවරණයක් ඇති කිරීම. |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | විශේෂ | 08 | දෙපාර්තමේන්තු ඉලක්ක හා සැලසුම් සපුරා ගැනීම සඳහා අධීක්ෂණ කළමනාකරු විශේෂ පන්තියේ සහ III, II, I අධීක්ෂණ කළමනාකරුවන් මෙහෙයවමින් ඔවුන් විසින් සිදු කරනු ලබන රාජකාරී අධීක්ෂණය කරමින් ප්‍රධාන ධාවනාගාර භාරව කටයුතු කිරීම, ධාවනාගාරවල සියළු කටයුතු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල හා ඔවුන්ගේ ආයතනික සහ පරිපාලනමය කටයුතු අධීක්ෂණය කිරීම, නඩත්තු කටයුතු සඳහා අදාල අමතර කොටස් ලිහිසි තෙල් , ඉන්ධන අදිය ඇනවුම් කිරීම. තොග පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම, ධාවනාගාරවලට අදාල ලේඛනගත භාණ්ඩ භාරව කටයුතු කිරීම, ඒවා නඩත්තු කිරීම, ඒවාට අදාල වාර්ෂික සමීක්ෂණ මණ්ඩල සඳහා සහභාගි වීම. ඉහළ කළමනාකරණය මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම සහ තමා යටතේ ඇති සියළු කාර්ය මණ්ඩලවල විනය, අන්තර් සම්බන්ධතා දියුණු කිරීම, එම සේවකයන්ගේ උසස් කිරීම් සඳහා පරීක්ෂණ මණ්ඩල වල සාමාජිකත්වය දැරීම. සාර්ථක දුම්රිය සේවාවන් පවත්වා ගැනීමට අදාලව දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | විශේෂ | 08 | දුම්රිය එන්ජින්, බලවේග කට්ටල මඟී සහ තිරිංග මැදිරි සේවා රිය පෙට්ටි හා තෙල් ටැංකි ආදී සියලුම දුම්රිය වාහන වල කාර්මික දෝෂ හඳුනා ගැනීම, අළුත්වැඩියා කටයුතු සැලසුම් කිරීම, නඩත්තු කිරීම් අධීක්ෂණය හා ඒවා ධාවනයට යෙදවීමට පෙර අදාල පරීක්ෂණ ධාවනයන්හී යෙදවීම හා සහතික කර ධාවනයට ලබා දීම. අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය යෝග්‍ය අමතර කොටස් හා උපාංග ලබා ගැනීමට කටයුතු කිරීම හා අවශ්‍ය උපදෙස් කාර්ය මණ්ඩලවලට ලබා දීම හා නඩත්තු කටයුතු වලට අදාල ලේඛණ හා වාර්තා නඩත්තු කිරීම ආදී III, II, I ශ්‍රේණිවලට අයත් අධීක්ෂණ කළමනාකරුවන්ගේ සියලුම කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය අධීක්ෂණය ලබා දීම. ධාවනාගාරයක අධීක්ෂණ කළමනාකරු (නඩත්තු) තනතුරට අදාල වූ කාර්යභාරයන් නිසි පරිදි සිදු කිරීම, අංශ කිහිපයක් සහ ධාවනාගාර කාර්යමණ්ඩලය සමඟ මනාව සම්බන්ධීකරණය කරමින් ඵලදායි දුම්රිය සේවාවක් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | විශේෂ | 05 | විශේෂ පන්තිය හා III, II, I අධීක්ෂණ කළමනාකරණ නිලධාරීන් විසින් සිදු කරනු ලබන සියලුම රාජකාරි නිසි ලෙස සිදුවන බව අධීක්ෂණය කිරීම, දුම්රිය කර්මාන්තශාලාවල සිදුවන අලුත්වැඩියා කටයුතු අධීක්ෂණය කිරීම හා ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු ඇතුළු කළමනාකාරිත්වය දැනුවත් කිරීම, කර්මාන්තශාලාවල වාර්ෂික ආයුධ හා උපකරණවල වාර්ෂික සමීක්ෂණ මණ්ඩල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් හා ආපදා කටයුතුවලදී පරීක්ෂණ පැවැත්වීම, දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික/ විදුලි) සේවයට අයත් සේවකයින්ගේ උසස් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම සහ දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | විශේෂ | 11 | දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් එන්ජින් ගැල් හා මැදිරි ඇතුළු අනෙකුත් යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, අදාල පරිදි අවශ්‍ය අමතර කොටස් අළුතින් නිශ්පාදනය කිරීම හා අළුත්වැඩියාවෙන් පසු එම දුම්රිය එන්ජින් මැදිරි ධාවනය කර සහතික කිරීම, එම කාර්යයන්ට අදාල යන්ත්‍රසූත්‍ර අමතර කොටස් යනාදිය රැස් කර ඇති ගබඩා පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම, ඔවුන් යටතේ සේවය කරන කාර්ය මණ්ඩලයේ ආයතනික කටයුතු සම්බන්ධ ලිපිගොනු, පැමිණීමේ වේලාව සටහන් කිරීම, වැටුප්, වෙනත් දීමනා ගෙවීම සඳහා අවශ්‍ය තොරතුරු සකස් කර ඉදිරිපත් කිරීම, යනාදි කාර්යාල කටයුතු ඉටු කරවා ගැනීම හා අධීක්ෂණය එම සේවකයින්ගේ උසස් කිරීම් සඳහා පවත්වනු ලබන පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම ඇතුළු III, II, I ශ්‍රේණිවලට අයත් අධීක්ෂණ කළමනාකරුවන්ගේ සියලුම කාර්යභාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය අධීක්ෂණය ලබා දීම. ඉහත සඳහන් සියළු කාර්යයන් අධීක්ෂණය කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම ආදී අධීක්ෂණ කළමනාකරුවෙකුගේ සියළු කාර්යභාරයන් ඉටු කිරීම. |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | විශේෂ | 07 | විශේෂ පන්තිය හා III, II, I සංඥා අධීක්ෂණ කළමනාකරුවන් විසින් සිදු කරනු ලබන සියලුම රාජකාරි නිසි ලෙස සිදුවන බව අධීක්ෂණය කිරීම. කර්මාන්තශාලාවල සිදු කරනු ලබන නිශ්පාදන කටයුතු/ අළුත්වැඩියා කටයුතු අධීක්ෂණය කිරීම. නව දුම්රිය සංඥා පද්ධති හා දුම්රිය හරස් මාර්ග ආරක්ෂක පද්ධති ස්ථාපිත කිරීම, පවතින පද්ධති අළුත්වැඩියාව හා නඩත්තු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම. සංඥා අංශවල වාර්ෂික ආයුධ හා උපකරණවල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් හා ආපදා කටයුතු වලදී පරීක්ෂණ පැවැත්වීම. මු.තා.ශි./ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර සේවයට අයත් සේවකයින් උසස් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම සහ දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |
| අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | විශේෂ | 13 | III, II, I සංඥා අධීක්ෂණ කළමනාකරුවන් විසින් සිදු කරනු ලබන සියලුම රාජකාරි නිසි ලෙස සිදුවන බව අධීක්ෂණය කිරීම. කර්මාන්තශාලාවල සිදු කරනු ලබන නිෂ්පාදන කටයුතු/ අළුත්වැඩියා කටයුතු අධීක්ෂණය කිරීම. නව දුම්රිය සංඥා පද්ධති හා දුම්රිය හරස් මාර්ග ආරක්ෂක පද්ධති ස්ථාපිත කිරීම, පවතින පද්ධති අළුත්වැඩියාව හා නඩත්තු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම. සංඥා අංශවල වාර්ෂික ආයුධ හා උපකරණවල වාර්ෂික සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම, විනය කඩවීම් හා ආපදා කටයුතු වලදී පරීක්ෂණ පැවැත්වීම. මු.තා.ශි./ දුම්රිය |

| | | | |
|---|---|---|---|
| | | | තාක්ෂණික කළමනාකරණ සහකාර සේවයට අයත් සේවකයින් උසස් කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකත්වය දැරීම සහ දුම්රිය ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | | | |
|---|---|---|---|
| I. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | - | 08 |
| II. | අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | - | 47 |
| III. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | - | 01 |
| IV. | අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | - | 14 |
| V. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (පාලම්) | - | 01 |
| VI. | අධීක්ෂණ කළමනාකරු (පාලම්) | - | 07 |
| VII. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | - | 08 |
| VIII. | අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | - | 08 |
| IX. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | - | 05 |
| X. | අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | - | 11 |
| XI. | ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | - | 07 |
| XII. | අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | - | 13 |

## 07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ. |
| සීමිත | අදාළ නොවේ. |
| කුසලතා | 100% |

සටහන - විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේදී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ය.

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.3 පළපුරුද්ද :

I. දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.
II. දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ම උපයා ගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාල සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධාරයා විසින් සිදු කරනු ලබයි. (උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 100යි.)

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.4.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය | 60 | අදාල නොවේ. |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | |
| තනතුරට අදාල කාර්යයන් පිළිබඳ තාක්ෂණික දැනුම | 20 | |
| විශේෂ දක්ෂතා | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

සටහන : I. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර අයදුම්පත් කැඳවීමේ නිවේදනය මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

III. ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොඅඩු ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (එම දෙගුණයකට නොඅඩු සංඛ්‍යාවට ඇතුළත් වන එකම දිනයකදී I ශ්‍රේණියට උසස්කර ඇති සමාන සේවා කාලයක් සහිත නිලධාරීන් සිටීනම් එම සියලුම නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

IV. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

V. තනතුරට අදාළ කාර්යයන් පිළිබඳ තාක්ෂණික දැනුම සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන ආකාරයකට පරීක්ෂා කරනු ලැබේ.

7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දැන්වීමක් මඟින් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින්.

08. **කාර්යක්ෂමතා කඩඉම් :** අදාළ නොවේ.

09. **රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :** අදාළ නොවේ.

10. **ශ්‍රේණි උසස් කිරීම් :** අදාළ නොවේ.

11. **තනතුරුවල පත් කිරීම් :**

11.1 **සුදුසුකම්**

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | අධීක්ෂණ කළමනාකරණ සේවයේ විශේෂ පන්තියේ තනතුරක වසර 03ක අඛණ්ඩ සේවා පළපුරුද්දක් ඇති නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් මෙම තනතුරු සඳහා පත් කරනු ලැබේ.<br><br>සටහන - ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති අවස්ථාවකදී අධීක්ෂණ කළමනාකරණ සේවයේ විශේෂ පන්තියේ නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරියා ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග/ ගොඩනැගිලි/ පාලම්/සංඥා හා විදුලි/ කර්මාන්තශාලා/ ධාවනාගාර) තනතුරුවලට පත් කරනු ලැබේ. |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (පාලම්) | |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | |
| ප්‍රධාන අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | |

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :** අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :

**සක්‍රීය සේවා කාලය** - සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

මෙම පටිපාටිය ක්‍රියාමත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN-07 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුමදෙනා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මකව විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන: 2023/12/31 දින දක්වා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා ජ්‍යෙෂ්ඨතාව අනුව උසස්වීම් ලබාදෙනු ලැබේ.

සකස් කලේ : ......................................

ඒ. ජේ. පී. අයිශානි
පරිපාලන නිලධාරී (පත්වීම් 1)
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.

පරීක්ෂා කලේ: ......................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

එච්. එම්. එස්. පී. හිසේරා
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන)
දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

නිර්දේශ ඉදිරිපත් කරමි.

අත්සන : ......................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
තනතුර: ..........දුම්රිය සාමාන්‍යාධිකාරී
නිල මුද්‍රාව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය : 2024.08.30

යොමු අංකය : MT/03/02/01/4/4

2022.07.28 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය අධීක්ෂණ කළමණාකරණ සේවයේ අධි පන්තියේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්,

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

ආර්. ඩබ්. ආර්. පේමසිරි
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
07 වන මහල,
සෙත්සිරිපාය, අදියර II,
බත්තරමුල්ල.

දිනය : 2022.09.09

නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය : PSC/EST/05-01-23/021/2021

දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය අධීක්ෂණ කළමණාකරණ සේවයේ අධි පන්තියේ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2022.07.28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : එම් ඒ බී දයා සෙනරත්

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2022.09.28

නිල මුද්‍රාව : ..........................................

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.